කාර්ය සාධන වාර්තාව
2009

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

දැක්ම

මගී හා භාණ්ඩ ප්‍රවාහනය සඳහා වන බහු ප්‍රවාහන මාධ්‍ය පරිසරයක් තුළ මූල්‍ය ස්වාධීනත්වයෙන් යුත් ගුණාත්මක දුම්රිය සේවාවක් සැපයීම.

මෙහෙවර

මගී හා භාණ්ඩ ප්‍රවාහනය සඳහා
ආරක්ෂිත, විශ්වාසදායී, නියමිත වේලාවට ධාවනය වන සකසුරුවම් හා කාර්යක්ෂම දුම්රිය ප්‍රවාහන සේවාවක් සපයමු.

අරමුණු

- ❖ දුම්රිය කාලසටහන් මගී අවශ්‍යතාවයන්ට අනුරූපව කාර්යක්ෂම සේවාවක් සැපයීම සඳහා සේවාවේ සංශෝධන සිදුකිරීම.
- ❖ පිරිහෙමින් පැවති වත්කම්වල කාර්යක්ෂමතාවය රඳවාගැනීම සඳහා පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම (උදා: දුම්රිය මාර්ගය, සංඥා පද්ධතිය, දුම්රිය ඇණිය).
- ❖ නව වත්කම් සඳහා ආයෝජන සිදුකිරීම මගින් වත්කම් පදනම ශක්තිමත් කිරීම (බලවේග කට්ටල, දුම්රිය එංජින්, මැදිරි).
- ❖ ආදායම් ප්‍රභවයන් ශක්තිමත් කිරීම.
- ❖ සංවිධානයේ ආයතනික රාමුව වර්තමාන ඉල්ලුමට (අභියෝගයන්ට) සරිලන ලෙස ප්‍රතිව්‍යුහගත කිරීම.
- ❖ මානව සම්පත් සංවර්ධනය.

පරිපාලන අංශයේ කාර්යසාධනය

පිරිස් පාලන කටයුතු

- ➢ දීර්ඝ කාලයක් තිස්සේ පුරප්පාඩුව පැවති තනතුරු සඳහා 2009 වසර තුළ 850 ක් සඳහා නව බඳවා ගැනීම් සිදුකරන ලදී.
- ➢ උසස්වීම් ක්‍රියාවලින් යථාවත් කොට නියමිත සම්මුඛ පරීක්ෂණ සහ විභාග පවත්වා තනතුරු 951ක් සඳහා 2009 වසර තුළදී උසස්වීම් ලබා දෙන ලදී.
- ➢ 2009 වසර තුළ සේවකයන් 60 දෙනෙකු විශ්‍රාම යන ලදී.

සේවක සබඳතා

වෘත්තිය සමිති සමග නිරන්තර සංවාදයන් අඛණ්ඩව පවත්වාගෙන යෑම සහ එමගින් හදිසි සේවා අත්හිටුවීම්, වැඩ වර්ජන, කඩාකප්පල්කාරී වැඩ අවම කිරීම.

මහජන සම්බන්ධතා

වසර 25 ක සේවා කාලයක් සම්පූර්ණ කළ දුම්රිය සේවකයන් ඇගයීම සඳහා සහතික සහ තෑගි ප්‍රදානෝත්සවයක් පවත්වා ඔවුන්ගේ සේවය ඇගයීම.

මානව සම්පත් කළමනාකරණය

දේශීය පුහුණුවීම් (ජර්මන් දුම්රිය කාර්මික අභ්‍යාස මධ්‍යස්ථානය)

2009 වසර තුළ මෙම ආයතනය මගින් පවත්වාගෙන යන ලද පාඨමාලා පහත දක්වා ඇත.

යන්ත්‍ර ශිල්පී පාඨමාලාව.
මෝටර් යාන්ත්‍රික ශිල්පී පාඨමාලාව.
විදුලි ශිල්පී පාඨමාලාව.
තාක්ෂණ ශිල්පී පාඨමාලාව.
මූලික විදුලි තාක්ෂණ පාඨමාලාව.
ඩීසල් එන්ජින් යාන්ත්‍රික ශිල්පී පාඨමාලාව.
පෑස්සුම් ශිල්පී පාඨමාලාව.
මූලික තාක්ෂණ පාඨමාලාව.
දැඩියාව හා ආතතිය පරීක්ෂා කිරීම පිළිබඳ පාඨමාලාව.

ශ්‍රී ලංකා ජර්මන් දුම්රිය කාර්මික අභ්‍යාස මධ්‍යස්ථානය මගින් 2009 වසර සඳහා පවත් වනු ලැබූ පූර්ණ කාලීන පාඨමාලා සඳහා බඳවා ගත් සිසුන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

පාඨමාලාව	බඳවාගනුලැබූ සිසුන් සංඛ්‍යාව
මෝටර් යාන්ත්‍රික ශිල්පී	22
ඩීසල් එන්ජින් යාන්ත්‍රික ශිල්පී	20
විදුලි ශිල්පී	25
පෑස්සුම් ශිල්පී	19
යන්ත්‍ර ශිල්පී	18

2009 වසර තුළ පූර්ණ කාලීන පාඨමාලා නිම කළ සිසුන් පිළිබඳ පහත වගුවෙන් විස්තර කෙරේ.

පාඨමාලාව	සංඛ්‍යාව
ඩීසල් එන්ජින් යාන්ත්‍රික ශිල්පි	16
විදුලි ශිල්පි	15
පෑස්සුම්කරු	21
යන්ත්‍ර ශිල්පි	14

2009 වසර තුළ පූර්ණ කාලීන පාඨමාලා පුහුණුව නිම කළ මුළු සිසුන් සංඛ්‍යාව 66 ක් වූ අතර පූර්ණකාලීන පාඨමාලා සඳහා සිසුන් 104 ක් අළුතින් බඳවා ගන්නා ලදී.

විදේශීය පුහුණුවීම්

ඉන්දියන් ණය ආධාර යටතේ ක්‍රියාත්මක වන මුහුදුබඩ දුම්රිය මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය තුළින් දුම්රිය සේවකයන් 600 ක් ඉන්දියාවට යවා පුහුණු කිරීමට අපේක්ෂා කරන අතර ඉන් සේවකයන් 147 ක් 2009 වසර අවසන් වන විට ඉන්දියාවට යවා අදාල පුහුණුවීම් ලබා දෙන ලදී.

අභ්‍යන්තර විගණන

පහත දැක්වෙන අංශයන් හි මෙම වසරෙහි අභ්‍යන්තර විගණන කටයුතු සිදු කරන ලදී.

අනු අංකය	ස්ථානය	ප්‍රමාණය
1	දුම්රිය ස්ථාන	150
2	උප දුම්රිය ස්ථාන	144
3	දිස්ත්‍රික් විදුලි සංදේශ පරීක්ෂක කාර්යාල	22
4	ධාවනාගාර	10
5	ස්ථිර මාර්ග පරීක්ෂක කාර්යාල	9
6	ගොඩනැගිලි පරීක්ෂක කාර්යාල	5
7	කර්මාන්ත ශාලා	2
8	ගිණුම් ශාඛා	10
9	පාලන අංශ	5
10	දුම්රිය ගබඩා	1

මෙම විගණන විමසුම් හරහා රුපියල් 10.00 - 100.00 අතර මුදල් විෂමතා 179 ක් ද, රුපියල් 101.00 - 500.00 අතර මුදල් විෂමතා 78 ක් ද රුපියල් 501.00 - 1000.00 අතර මුදල් විෂමතා 09 ක්ද, රුපියල් 5000.00 ට වැඩි මුදල් විෂමතා 16 ක් ද අනාවරණය කරගනු ලැබීමෙන් අනතුරුව ඉදිරි පියවරයන් සඳහා අනාවරණය වූ විෂමතා/වැරදි/අත්හැරීම් සම්බන්ධයෙන් ඒ ඒ උප දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත වාර්තා කරනු ලැබීය.

ඉහත වගුවේ දක්වා ඇති විගණන කටයුතු වලට අමතරව මෙම වසර තුළ මරදාන, රත්මලාන හා රාගම ගබඩා වල තොග සමීක්ෂණයන් ද සිදු කරන ලදී.

විගණකාධිපති ගේ විගණන විමසුම්

අනු අංකය	විගණන විමසුම්	ප්‍රමාණය
1	2009 ජනවාරි 01 දිනට පිළිතුරු සැපයීමට තිබූ විගණන විමසුම්	28
2	2009 වසර තුළ ලද විගණන විමසුම්	48
3	2009 වර්ෂය තුළ දී පිළිතුරු සැපයූ විගණන විමසුම්	75
4	2009 දෙසැම්බර් 31 දිනට පිළිතුරු නොසැපයූ විගණන විමසුම්	01

මෙහෙයුම් අංශයේ කාර්ය සාධනය

දුම්රිය සේවාව ඉහළ නැන්වීම උදෙසා පහත දැක්වෙන ක්‍රියාකාරකම් 2009 වසර තුළදී සිදුකරන ලදී.

2009-04-05 දින සිට කොළඹ කොටුව සිට මඩකලපුව දක්වාත්, 2009-04-06 දින සිට මඩකලපුව සිට කොළඹ කොටුව දක්වාත් නව නගරාන්තර සීඝ්‍රගාමී දුම්රිය සේවයක් උදය දේවී නමින් ධාවනයට එක්කිරීම.

2009-06-06 දින සිට වව්නියාව දක්වා ධාවනය වූ දුම්රියයන් තාන්ඩිකුලම් දක්වා ධාවනය කිරීමටත්, එම දුම්රියයන් වල ආපසු ගමන් වාරද තාන්ඩිකුලම් සිට ඇරඹීමට කටයුතු කිරීම.

මෙම වසර තුළ මඩකලපුව/පොලොන්නරුව/මඩකලපුව හා ත්‍රිකුණාමලය/ගල්ඔය/ත්‍රිකුණාමලය අතර නව රේල් බස් ව්‍යාපෘතියක් ආරම්භ කිරීම.

කොළඹ කොටුව/මහව/කොළඹ කොටුව අතර ධාවනය වූ මහව කාර්යාලීය දුම්රියයන්ට මගී පහසුව සඳහා නව බලවේග කට්ටල (එස් 10) යොදවා අඩු කාලයකින් ගමන් කිරීමට හැකිවන ලෙස සංශෝධනය කිරීම.

කොළඹ කොටුව/වවුනියාව/කොළඹ කොටුව අතර ධාවනය වූ යාල්දේවී සීඝ්‍රගාමී දුම්රියයන් දෙක 2009-05-06 දින සිට නගරාන්තර සීඝ්‍රගාමී දුම්රියන් දෙකක් වශයෙන් හඳුන්වා දීම හා ඒ හරහා පෙර දී එම දුම්රිය නතර කළ දුම්රිය ස්ථානවලින් ගමන් ආරම්භ කරන මගී පහසුව සඳහා කොළඹ කොටුව/ත්‍රිකුණාමලය/කොළඹ කොටුව (7081/7082) අතර ධාවනය වන මගී දුම්රියයන්ට මැදිරි 5 ක් අමුණා මහව දක්වා ගෙන ගොස් එතැන් සිට වෙනමම දුම්රියක් වශයෙන් මැදවච්චිය දක්වා ද නැවත ආපසු මැදවච්චිය සිට මහව දක්වාත් පැමිණ නැවත ත්‍රිකුණාමලය සිට කොළඹ කොටුව (7082) දක්වා ධාවනය වන දුම්රියට අමුණා කොළඹ කොටුවට පැමිණීමට පහසුකම් ලබා දීම.

2009-03-09 දින සිට සමුද්‍රදේවී දුම්රිය සඳහා බලවේග කට්ටලයක් (එස් 10) හඳුන්වා දීම.

2009-08-31 දින සිට අංක 8751 දරණ දුම්රියට නව චීන බලවේග කට්ටලයක් හඳුන්වා දීම හේතුවෙන් පානදුර-දකුණු කළුතර අතර පාර්සල් ගැටළුව විසඳීම සඳහා අංක 8741 දුම්රිය දකුණු කළුතර දක්වා දීර්ඝ කිරීම.

2009-11-5 දින සිට අංක 8390 දරණ දුම්රියට සොරුන්ගෙන් වන හානි අවම කිරීමට සීඝ්‍රගාමී ධාවනයක් ලබා දීම.

2009-06-12 දින සිට මෙතෙක් කොස්ගම දක්වා ධාවනය වූ අංක 9268 දරණ දුම්රිය වෙනුවට අංක 9269 දරණ දුම්රිය කොස්ගම දක්වා ධාවනය කරවීම.

2009-09-17 දින සිට අංක 1140 කොළඹ කොටුව/වේයන්ගොඩ සහ අංක 1539 වේයන්ගොඩ/කොළඹ කොටුව අතර දුම්රිය ධාවනය.

2009-08-24 දින සිට අංක 1152 කොළඹ කොටුව/ පොල්ගහවෙල සහ අංක 1576 පොල්ගහවෙල /කොළඹ කොටුව අතර දුම්රිය ධාවනය

2009-05-06 දින සිදුවූ උතුරු මාර්ගයේ දුම්රියයන් ගේ කාලසටහන් සංශෝධනය නිසා ඊට සමගාමීව ප්‍රධාන මාර්ගයේ දුම්රියයන් ගේ සංශෝධනයන් සිදුකිරීම.

අළුතින් දුම්රිය සේවය සඳහා එක් කිරීමකින් තොරව මගී ධාරිතාවය ඉහළ නැංවීමේ අරමුණින් මගී ජනතාවගේ ඉල්ලුමට සරිලන පරිදි මගී දුම්රිය කාලසටහන් සංශෝධනයන් සිදුකරන ලදී.

2009-06-06 දින සිට වසර 20කට පසු වව්නියාවෙන් ඔබ්බට (තාන්ඩිකුලම්) දුම්රිය ගමන්කළ අවස්ථාව.

නැගෙනහිර පලාත තුළ අළුතින් ආරම්භ කළ නව රේල් බස් ව්‍යාපෘතිය යටතේ හඳුන්වාදුන් නව රේල් බසයක් ධාවනයට සූදානමින්.

කොළඹ කොටුව - මඩකලපුව අතර අලුතින් හඳුන්වාදුන් උදය දේවී සීඝ්‍රගාමී දුම්රිය ධාවනය අතර තුර.

පීලිපැනීම්

විස්තරය	2008	2009
ධාවන මාර්ග තුළ	60	63
අංගන	104	108
එකතුව	164	171

2008 වර්ෂයේ දී 164 ක් වූ දුම්රිය පීලි පැනීම් 2009 වර්ෂයේ දී 171 දක්වා ඉහළ ගොස් ඇත.

2009-06-06**දින තලාව දුම්රිය ස්ථානය අසල දී කොළඹ-අනුරාධපුර තෙල් ප්‍රවාහන දුම්රිය පීලිපැනීම.**

දුම්රිය අනතුරු

පහත වගුව මගින් 2008 හා 2009 වසරයන්හි දුම්රිය හරස් මාර්ග වලදී සිදුවූ අනතුරු සහ අනෙකුත් අනතුරු දක්වා ඇත

විස්තරය	2008	2009
දුම්රිය ගැටීම්	09	05
අනෙකුත් අනතුරු	24	15
හරස් මාර්ග වලදී මෝටර් රථ ගැටීම්	43	66
මෝටර් වාහන මගින් හරස් මාර්ග බාධක වලට සිදුවූ හානිය	207	181
ගිනි ගැනීම්	01	01
ත්‍රස්ත ප්‍රහාර	06	
දුම්රියේ හැපීම නිසා සිදුවූ ගව මරණ	01	25
දුම්රියේ හැපීම නිසා සිදුවූ අලි ඇතුන් මරණ	06	09

දුම්රිය හරස් මාර්ග වල දී සිදුවන ගැටීම් ඇතුළු අනෙක් හදිසි අනතුරු සංඛ්‍යාව 2008 වර්ෂයේ දී 305 ක් වූ අතර 2009 වර්ෂයේ දී 302 ක් විය. මෙම වසර තුළ දුම්රිය ගැටීම් 05 ක් හා අනෙකුත් අනතුරු 15 ක් ලෙස දක්නට ලැබේ. එය පසුගිය වසරට සාපේක්ෂව යම් අඩුවීමක් ලෙස දැක්විය හැකිය. හරස් මාර්ගයන්හිදී මෝටර් රථ ගැටීම් සංඛ්‍යාව 2008 වසරට සාපේක්ෂව ඉහළ ගොස් ඇති අතර මෝටර් රථ මගින් හරස් මාර්ග වලට වූ අනතුරු 207 සිට 181 දක්වා අඩුවී ඇත. 30 වසරක කුරිරු යුද්ධය අවසන් වීමත් සමග මෙම වසර තුළ එකදු ත්‍රස්ත ප්‍රහාරයක් වත් වාර්තා නොවිය. දුම්රියෙහි ගැටීම නිසා සිදුවූ ගව මරණ සංඛ්‍යාව 2008 වසරේ දී 01 වුවද එය 2009 වසරේ 25 ක් වැනි ඉතා ඉහළ සංඛ්‍යාවක් ලෙස දක්නට ලැබේ. අලි ඇතුන් දුම්රියෙහි ගැටීම නිසා සිදුවූ මරණ සංඛ්‍යාව මෙම වසරේ දී 09 ක් විය.

දුම්රිය අනතුරු නිසා මහජනතාවට සිදුවූ හානි

විස්තරය	2008		2009	
	තුවාලවීම්	මරණ	තුවාලවීම්	මරණ
පීළිපැනීම් නිසා සිදුවූ දුම්රිය මගින් තුවාල වීම් හා මරණ	06	-	10	-
දුම්රිය ගැටීම නිසා සිදුවූ දුම්රිය මගින් තුවාල වීම් හා මරණ	12	01	02	-
දුම්රියෙන් වැටීම නිසා සිදුවූ දුම්රිය මගින් තුවාල වීම් හා මරණ	03	-	21	01
දුම්රියට ගල් ගැසීම නිසා සිදුවූ තුවාල හා මරණ	04	-	09	-
දුම්රිය හරස් මාර්ගයන්හිදී රථ වාහන දුම්රිය සමග ගැටීම නිසා සිදුවූ සාමාන්‍ය ජනතාවට සිදුවූ අනතුරු	33	16	83	20
දුම්රිය මාර්ගයේ දී දුම්රියේ ගැටීම හේතුවෙන් සිදුවූ සියදිවි නසා ගැනීම්	140	80	93	98

2009 වසර තුළ පීළිපැනීම් හේතුවෙන් මගීන් 10 කට තුවාල සිදුවී ඇති අතර මරණ වාර්තා නොවිය. දුම්රියේ ගැටීම නිසා මගීන් 02 කට තුවාල සිදුවිය. 2008 වසර තුළ දුම්රියෙන් වැටීම නිසා මගී මරණ වාර්තා නොවුවද 2009 වසර තුළ එක් මරණයක් වාර්තා විය. එමෙන්ම රථ වාහන හරස් මාර්ග වලදී දුම්රියෙහි ගැටීම නිසා සිදුවූ මරණ 2008 දී 16 ක් වූ අතර එය 2009 දී 20 දක්වා වැඩිවී ඇත. මෙම අනතුරු වලින් බහුතරය ආරක්ෂිත දුම්රිය හරස් මාර්ගයන්හිදී රථ වාහන රියදුරන් ගේ නොසැලකිල්ල නිසා සිදුවූ අනතුරු ලෙස දැක්විය හැක. දුම්රියෙහි ගැටී සියදිවි නසා ගැනීම් 2008 වසරේදී 80 ක් වූ අතර එය 2009 වසරේදී 98 ක් ලෙස වාර්තා විය.

කාලානුරූප ධාවනය

විස්තරය	අනුමත දුම්රිය සංඛ්‍යාව	ධාවනය වූ දුම්රිය සංඛ්‍යාව	නියමිත වේලාවට ධාවනය වූ දුම්රිය සංඛ්‍යාව	ප්‍රමාදවී ධාවනයවීම්				අවලංගු වූ දුම්රිය ප්‍රමාණය
				මිනිත්තු 06'-10'	11'-30'	31'-60'	60 ට වැඩි	
i. මගී	**117,927**	**109,717**	**38,483**	**16,812**	**34,575**	**12,596**	**8,210**	**8,210**
තදාසන්න	65,613	63,799	26,730	11,413	20,090	4,499	1,067	1,814
දුරස්ථ හා නගරාන්තර	17,013	16,924	2,633	2,090	5,883	3,646	2,672	89
ප්‍රාදේශීය	35,301	28,994	9,120	3,309	8,602	4,451	3,512	6,307
ii. භාණ්ඩ	**7,953**	**4,978**	**693**	**100**	**341**	**602**	**3,242**	**2,975**
එකතුව	**125,880**	**114,695**	**39,176**	**16,912**	**34,916**	**13,198**	**10,493**	**11,185**

මෙම වසර තුළ ධාවනය සඳහා සැලසුම් කළ මගී දුම්රිය ප්‍රමාණය 117927 ක් වූ අතර ධාවනය වූ ප්‍රමාණය 109717 ක් විය. එය ප්‍රතිශතයක් ලෙස 93% විය. භාණ්ඩ දුම්රිය සම්බන්ධයෙන් ගත් කළ ධාවනය සඳහා අපේක්ෂිත දුම්රිය ප්‍රමාණයෙන් ධාවනය වූ ප්‍රමාණය 63% ක් විය. සමස්ථයක් වශයෙන් ගත් කළ අනුමත දුම්රිය සංඛ්‍යාව වූ 125880 න් 114695 ක් වූ ධාවනය වූ මුළු දුම්රිය ප්‍රමාණය ප්‍රතිශතයක් වශයෙන් ගත් කළ 91% ක් විය.

නියමිත වේලාවට ධාවනය වීම් මගී දුම්රිය 35% ක් හා භාණ්ඩ දුම්රිය 14% ක් වූ අතර ඒ අනුව භාණ්ඩ හා මගී යන දෙඅංශයෙන් ම නියමිත වේලාවට දුම්රිය ධාවනය වීමේ ප්‍රතිශතය 34% ක් වූ අතර එය 2008 වසරේ දී 30% ක් විය.

දුම්රිය කිලෝමීටර ප්‍රමාණය

විස්තරය	බලවේග කට්ටල ධාවනයවීම්	බලවේග කට්ටල අවලංගුවීම්	ඩීසල් දුම්රිය ධාවනයවීම්	ඩීසල් දුම්රිය අවලංගුවීම්	ධාවනයවීම් එකතුව	අවලංගුවීම් එකතුව
i **මගී**	**3,046,226**	**57,560**	**5,937,066**	**277,313**	**8,983,292**	**334,873**
තදාසන්න	2,947,326	45,218	774,021	14,282	3,721,347	59,500
දූරස්ථ/ නගරාන්තර			3,593,956	54,804	3,593,956	54,804
ප්‍රාදේශීය	98,900	12,342	1,569,089	208,227	1,667,989	220,569
ii. **භාණ්ඩ**			**326,669**	**182,203**	**326,669**	**182,203**
iii. **හිස් දුම්රිය**	**20,152**		**59,930**		**80,082**	
iv. **සැහැල්ලු එංජින්**			**49,861**		**49,861**	
එකතුව	**3,066,378**	**57,560**	**6,373,526**	**459,516**	**9,439,904**	**517,076**

විශේෂ දුම්රිය කිලෝ මීටර

විස්තරය	මගී/ බඩු සහිත ඩීසල් දුම්රිය	මගී/ බඩු රහිත ඩීසල් දුම්රිය	මගී/ බඩු සහිත වාෂ්ප දුම්රිය	මගී/ බඩු රහිත වාෂ්ප දුම්රිය	එකතුව
විශේෂ මගී දුම්රිය	43,844	665			44,509
විශේෂ බඩු දුම්රිය	56,956				56,956
සේවා දුම්රිය	13,816	1,153			14,969
හිතාචි	458	394			852
ට්‍රයල්	1,141				1,141
වයිස්රෝයි	339		1,499	429	2,267
බැලස්ට්	24,311				24,311
මෝටර් ට්‍රොලි	19,803				19,803
හුණුගල්	7,795	7,795			15,590
ට්‍රැක් මෝටර් කාර්	864				864
බ්‍රේක් ඩවුන්/ක්‍රියා විරහිත	2,905				2,905
වෙනත්	578				578
එකතුව	**172,810**	**10,007**	**1,499**	**429**	**184,745**

දුම්රිය ඇණිය

මෑත අතීතයේ සේවාවන් පවත්වාගෙන යෑම සඳහා ප්‍රධාන වශයෙන් උපයෝගී කර ගන්නා එන්ජින් කාණ්ඩය වන ඩීසල් විදුලි එන්ජින් සංඛ්‍යාව දිනකට සැපයුණු සංඛ්‍යාව 50 ආසන්නයේ පැවතුනි. මෙම තත්වය වැඩි දියුණු කිරීම සඳහා දුම්රිය එන්ජින් අළුත්වැඩියා කිරීමේ දී කර්මාන්ත ශාලාව හා ධාවනාගාරයේ දී ගතවන කාල චක්‍රය තව දුරටත් කෙටි කිරීම සඳහා හදිසි වැඩසටහනක් හඳුන්වා දෙන ලදී. ධාවනාගාර වැඩි දියුණු කිරීමේ වැඩසටහන මගින් එදිනෙදා අළුත්වැඩියා කිරීමේ වැඩසටහන් වල ගුණාත්මකභාවය වැඩි කිරීමට හැකි විය. වසර අවසන් වන විට දිනකට සැපයෙන ඩීසල් විදුලි එන්ජින් සංඛ්‍යාව 55 ආසන්නයට ගෙන ඒමට හැකි විය.

නව බලවේග කට්ටල 15 ක් හඳුන්වා දීම මගින් කොළඹ තදාසන්න සේවය ශක්තිමත් කිරීමට හැකි විය. මෙහිදී අනුගමනය කළ උපක්‍රමය වූයේ තදාසන්න සේවා දුම්රිය වල මගී ධාරිතාවය ඉහළ නැංවීමය. මේ සඳහා කාර්ය බහුල කාල පරිච්ඡේදයන්හි ද්විත්ව බලවේග කට්ටල යොදා ගන්නා ලදී.

චීනයෙන් ආනයනය කරන ලද නව මගී මැදිරි 100 ක් ඇණියට එකතු කිරීම මගින් මගී දුම්රිය සේවාවන් වල පහසුකම් තව දුරටත් වැඩි කිරීමට හැකි විය. එසේ වුවද ධාවනයේ දී මතු වූ කාර්මික ගැටළු කිහිපයක් නිසා තාවකාලික වශයෙන් මෙම මැදිරි රඹුක්කනින් ඉහළ ධාවනයේ යෙදවීම නතර කිරීමට සිදුවිය. ජනප්‍රිය දුරස්ථ සේවා සඳහා යොදා තිබූ එන්ජිමකින් ධාවන බලය සැපයූ මගී මැදිරි

වලින් සෑදුණු දුම්රියයන් වෙනුවට ප්‍රථම වරට බලවේග කට්ටල යොදා ගන්නා ලදී. මෙමගින් සමුද්‍රදේවී/ මහව වැනි දුම්රියයන් ගේ කලට වේලාවට ධාවනය වීම සාර්ථක කරගන්නා ලදී.

පහත දැක්වෙන සටහන මගින් රත්මලාන කර්මාන්තශාලාවේ සිදුකළ ප්‍රධාන අළුත් වැඩියාවන් පෙන්නුම් කරයි.

ඇංජින්/ගැල්/මැදිරි නඩත්තුව

විස්තරය	ඉලක්කය	නිමකළ ප්‍රගතිය
එංජින් සහ බලවේග කට්ටල අළුත්වැඩියාව	58	45
මැදිරි අළුත්වැඩියාවන්	295	204
ගැල් අළුත්වැඩියාවන්	151	151

මීට අමතරව ධාවනයෙන් ඉවත් කර තිබූ එම් 5 වර්ගයේ එන්ජින් දෙකක් නව ඩීසල් එන්ජින් සවිකොට සේවයට යොදවන ලදී. තවදුරටත් මගී මැදිරි 15 පුනරුත්ථාපනය කොට සේවයට එක් කරන ලදී.

ධාවන බල සැපයුම

ධාවන බල යටිතල පහසුකම්

රු.මි. 120 ක වියදමින් කොළඹ ධාවනාගාර වැඩි දියුණුකිරීම් ව්‍යාපෘතිය යටතේ පහත දක්වා ඇති ප්‍රගතිය ලබා ඇත.

1. ***මාලිගාවත්ත අංගනය***
   කර්මාන්ත ශාලාව සහ මගී මැදිරි ශුද්ධ කිරීමේ පද්ධතිය නවීකරණය කොට උත්කර්ශණ යන්ත්‍රය (Hoist) සවිකිරීම. ජලය බැස යාම ක්‍රමවත් කිරීම සඳහා කාණු පද්ධතිය පිළිසකර කරන ලදී.

2. ***ධාවනාගාරය -දෙමටගොඩ***
   සියළුම අපහරණ ඉවත්කොට ටර්න් ටේබල් නැවත යථාවත් කිරීම.

3. ***කොළඹ අංගනය***
   කොළඹ අංගනයේ කර්මාන්ත ශාලාව නවීකරණය කිරීම. ෂන්ටින් රියදුරු සඳහා විවේක කාමර ඉදිකර භාර දෙන ලදී.

4. ***බලවේග ධාවනාගාරය - මාලිගාවත්ත***
   නව කර්මාන්තශාලාවක් ඉදිකිරීම.

5. ***විදුලි බලවේග ධාවනාගාරය***
   ධාවනාගාර ගොඩනැගිල්ලක් අළුතින් එක්කිරීම සහ එහි කාර්ය මණ්ඩලය සඳහා විවේක කාමර පහසුකම් ලබා දීම.

මුහුදුබඩ දුම්රිය මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ මාලිගාවත්ත, අලුත්ගම හා ගාල්ල යන ස්ථානයන් හි ධාවනාගාර ඉදිකිරීමේ ආරම්භක කටයුතු සම්පූර්ණ කරන ලදී.

සාමාන්‍ය දෛනික ධාවන බල සැපයුම

ඩීසල් ජලවිදුලිදුම්රිය එංජින්

විස්තරය	W1	W2	W3	Y	S5
නඩත්තුවේ පවත්නා ප්‍රමාණය	3	2	10	28	3
සේවය සඳහා අවශ්‍ය ප්‍රමාණය	2	0	8	20	2
සේවය සඳහා ලැබූ ප්‍රමාණය	1	0	8	20	1

ඩීසල් විදුලි එංජින්

විස්තරය	M2	M4	M5	M5A	M5B	M5C	M6	M7	M8	M8A	M9
නඩත්තුවේ පවත්නා ප්‍රමාණය	13	14	0	0	4	6	14	15	8	2	10
සේවය සඳහා අවශ්‍ය ප්‍රමාණය	10	10	0	0	3	4	11	11	6	1	4
සේවය සඳහා ලැබූ ප්‍රමාණය	10	8	0	0	2	4	10	9	5	1	3

බලවේග කට්ටල

විස්තරය	S3	S6	S7	S8	S9	S10
නඩත්තුවේ පවත්නා ප්‍රමාණය	0	4	5	20	15	15
සේවය සඳහා අවශ්‍ය ප්‍රමාණය	0	2	2	15	10	14
සේවය සඳහා ලැබූ ප්‍රමාණය	0	1	1	15	10	12

මෙම වසර තුළ සේවා පවත්වාගෙන යෑම සඳහා අවශ්‍ය සාමාන්‍ය දෛනික ඩීසල් එංජින් සංඛ්‍යාව 60 ක් වූ අතර එය 52 මට්ටමක පහත්වාගෙන යෑමට හැකි විය. එමෙන්ම බලවේග කට්ටල 43ක් සාමාන්‍ය සේවා අවශ්‍යතා සපුරාලීම සඳහා මෙම වසර තුළ අවශ්‍ය වූ අතර එය 39 මට්ටමේ පවත්වාගෙන යෑමට හැකියාව ලැබුණි.

යටිතල පහසුකම්

දුම්රිය මාර්ග සංවර්ධනය

වාර්ෂික දුම්රිය මාර්ග පුනරුත්ථාපන වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කළ අතර දුම්රිය මාර්ගයේ දුර්වලතාවයන් හේතුවෙන් වර්ෂයේ මුල දී පනවා තිබූ වේගසීමා 810 න් වර්ෂය තුළ දී වේගසීමා 460 ක් (92.1 කි.මී) ඉවත්කිරීමට හැකි විය. කෙසේ වුවද ප්‍රමාණවත් ආයෝජන මෑත අතීතයේ සිදුවී නොමැති නිසා මෙම වත්කම් වල සීඝ්‍ර පිරිහීමක් පසුගිය දශකය තුළ දක්නට ලැබුණි. ඒ අනුව අඛණ්ඩව සිදුවන මෙම තත්වය නිසා වේගසීමාවන් පැනවීමට දිගින් දිගටම සිදුවිය.

මෙම වර්ෂය තුළ දී නවපීලි 1,197 ක්, කොන්ක්‍රීට් සිල්පර 46,515 ක්, දැව සිල්පර 143,667 ක් ද සහ බැලස්ට් කියුබ් 22,327 ක් දුම්රිය මාර්ගය ශක්තිමත් කිරීම සඳහා යොදවන ලදී.

මාර්ග නඩත්තුව සඳහා උපයෝගී කර ගත් ද්‍රව්‍ය

උපයෝගී කර ගත් ද්‍රව්‍ය	ප්‍රමාණය
රේල් පීලි (90*66')	1,197
රේල් පීලි (45'S/H)	2,500
දැව සිල්පර	143,667
කොන්ක්‍රීට් සිල්පර	46,515
බැලස්ට් (කියුබ්)	22,327
සේවා දුම්රිය	401

නඩත්තු කටයුතු

විස්තරය	පැයට කි.මී. 10 ට අඩු	පැයට කි.මී. 10 ට වැඩි
2009-1-1 දින වන විට පැවති වේග සීමාවන් ප්‍රමාණය	85	727
2009 වර්ෂය තුළ ඉවත් කළ වේග සීමාවන් ප්‍රමාණය	85	514
2009 වර්ෂය තුළ අළුතින් එක්වූ වේග සීමාවන් ප්‍රමාණය	85	472
2010-01-01 වන විට පැවති වේග සීමාවන් ප්‍රමාණය	85	685

සීමිත ප්‍රතිපාදන මධ්‍යයේ වුවද පහත දක්වා ඇති නව මාර්ග ඉදිකිරීම් ද මෙම වසර තුළ දී සිදු කරන ලදී.

කුඩහකපොල සිට සීදුව දක්වා (ද්විත්ව) - කි.මී. 3
වව්නියාව සිට තාන්ඩිකුලම් - කි.මී. 3
තාන්ඩිකුලම් සිට ඕමන්තේ - කි.මී. 10 (ඉදිකිරීම් සිදුවෙමින් පවතී)
ඔරුගොඩවත්ත සිට කැළණිය - කි.මී. 2 (ඉදිකිරීම් සිදුවෙමින් පවතී)
කළුතර දකුණ සිට පයාගල දකුණ - (මූලික ඉදිකිරීම් සිදුවෙමින් පවතී)

පාළම්

- මීරිගම 1X100′ පාළමේ උපරි ව්‍යුහයේ ඉදිකිරීම් කටයුතු නිම කිරීම.
- බෙන්තොට 1X100′ පාළමේ උපරි ව්‍යුහයේ ඉදිකිරීම් කටයුතු නිම කිරීම.
- ප්‍රධාන මාර්ගයේ සැ.93 ද.4, සැ.104 ද. 74, සැ. 116 ද.3 යන ස්ථානයන් හි පාලම් වල විශාල සිල්පර වෙනුවට (Longitudinal) පාළමේ මතුපිට නවීකරණය කිරීම.
- තාන්ඩිකුලම් සිට ඕමන්තේ දක්වා වූ අබලන්වූ පාළම් 02 ක අළුත්වැඩියා කිරීම් අවසන් කළ අතර එක් පාළමක අළුත්වැඩියාවන් සිදුකෙරෙමින් පවතී.
- බෙන්තොට, වැල්ලවත්ත පාළම් වල දිරාගිය කොටස් ඉවත් කර අළුත්වැඩියා කිරීම.
- කොටගල, කුඩාවැව, බත්තුළුඔය, සෙනරත්ගම පාළම් හි තත්වය පරීක්ෂා කර ඇගයීමට ලක්කිරීම.

ගොඩනැගිලි

පහත දැක්වෙන ගොඩනැගිලි වල වැඩිදියුණු කිරීම් සහ පුනරුත්ථාපන කටයුතු සම්පූර්ණ කරන ලදී.

- දුම්රිය ස්ථාන- 42
- කාර්යාල/ගබඩා/සාමාජ ආයතන- 10
- නිල නිවාස සහ සුළු සේවක නිවාස - 43
- ජල සහ විදුලි සැපයුම - 19
- නවාතැන් බංගලා සහ විවේක කාමර - 15
- කර්මාන්තශාලා සහ අදාල වෙනත් ව්‍යුහයන් - 08
- තාප්ප සහ බිම් ගෙවල් - 06
- ජලය බැසයාමේ කාණු පද්ධති - 07
- පාළම් වල යටි ව්‍යුහයන් -08

සංඥා පද්ධතිය

2008 වසරේ දී වාර්ෂික සංඥා දෝෂ ප්‍රමාණය 2806 ක් වුවද 2009 වසරේ දී එය 2193 දක්වා අඩුකර ගැනීමට හැකිවිය. එය ප්‍රතිශතයක් වශයෙන් ගත් කළ 21% කින් පහත දැමීමක් විය.2008 වසරට සාපේක්ෂව 2009 වසර තුළදී දෛනික සාමාන්‍ය දෝෂ ප්‍රමාණය 8 සිට 6 දක්වා අඩුකර ගැනීමට සමත්වී ඇත.

සංඥා දෝෂ ප්‍රමාණය

දිස්ත්‍රික්කය	2008	2009
මධ්‍යම දිස්ත්‍රික්කය	1,177	835
පහල දිස්ත්‍රික්කය	682	631
උතුරු දිස්ත්‍රික්කය	299	333
ඉහළ දිස්ත්‍රික්කය	648	494
එකතුව	**2,806**	**2,193**
සාමාන්‍ය දෝෂ (දිනකට)	8	6

සංඥා පද්ධතියේ නඩත්තුව යටතේ මධ්‍යගත (C/L) අංගන 06 ක හා යාන්ත්‍රික (Mechanical) අංගන 06 ක නඩත්තු කටයුතු කිරීමට සැලසුම් කළ අතර වසර අවසන් වන විට මධ්‍යගත අංගන 02 හා යාන්ත්‍රික අංගන 04 ක නඩත්තු කටයුතු අවසන් කරන ලදී.

මරදාන /කොටුව 4 වන මාර්ගය හා ඔරුගොඩවත්ත/කැළණිය 3 වන මාර්ගය ඉදිකිරීමේ ව්‍යාපෘතියන් හි වසර අවසන් වන විට සැලසුම් කටයුතු සම්පූර්ණ කර ඉදිරි කටයුතු අරඹන ලදී.

මරදාන/ වාද්දුව අතර නව වර්ණ සංඥා පද්ධතියක් ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතියෙහි තාක්ෂණ ඇගයීම් කටයුතු අවසන් කරන ලදී.

දුම්රිය හරස් මාර්ග

2009-01-01 දින වන විට හරස් මාර්ග 315 ක් දෙපාර්තමේන්තුව මගින් නඩත්තු කරමින් පැවති අතර 2009 වසර තුළ හරස් මාර්ග 10 ක ඉදිකිරීම් කටයුතු අපේක්ෂා කළ ද එය 13 දක්වා වසර අවසන් වන විට ඉහළ දැමීමට හැකිවිය. ඒ අනුව පේරලන්ද, ඉඳිපරපේ, පොල්ගහවෙල දුම්රිය පල පාර, කටුනායක (Cargo Line), ගැටඹේ, අමුණුගම, මුත්තෙට්ටුගල, මුල්ගම්පොල, පිලිමතලාව, කාක්කපල්ලිය, කොලතැන්න, දෙයියන්නෙවෙල හා බණ්ඩාරවෙල දුම්රිය පල පාර යන ස්ථානයන් හි හරස් මාර්ග ඉදිකිරීම් අවසන් කරන ලදී.

දුම්රිය ස්ථාන ප්‍රවර්ධනය

2009 වසර තුළ විවෘත කළ දුම්රිය ස්ථාන ප්‍රමාණය 2 ක් වූ අතර ඒවා නම් ගෙලිඔය, තාන්ඩිකලම් දුම්රිය ස්ථානයන් වේ.

එම වසර තුළදීම උප දුම්රිය ස්ථානයන් 3ක් විවෘත කළ අතර ඒවා නම් මීගම්මන, පල්ලෙතලවින්න සහ පැගිරිවත්ත උප දුම්රිය ස්ථානයන්ය.

තාන්ඩිකුලම් දුම්රිය ස්ථානය.

ගෙලිඔය දුම්රිය ස්ථානය.

පල්ලෙතලවින්න දුම්රිය නැවතුම.

මීගම්මන දුම්රිය නැවතුම.

වාණිජ සහ අලෙවි කාර්ය සාධනය

ඇස්තමේන්තු ආදායම් හා තත්‍ය ආදායම්

විස්තරය	**මූලික ඇස්තමේන්තු(රු.මි)**	**තත්‍ය ආදායම (රු. මි)**
ආදායම		
මගී ප්‍රවාහනය	3018	3266
භාණ්ඩ	308	301
විවිධ	620	432

මගී ප්‍රවාහනය

විස්තරය	**මගී සංඛ්‍යාව**	**මගී ආදායම**
සාමාන්‍ය ප්‍රවේශපත් මගීන්	53,707,188	2,489,656,092
වාර ප්‍රවේශපත් මගීන්	48,100,260	776,615,161
එකතුව	***101,807,448***	**3,266,271,253**

2008 වසරට සාපේක්ෂව දුම්රිය සේවය භාවිතා කළ මගී සංඛ්‍යාව අඩුවී ඇත . එය 2008 වසරේ මිලියන 104 ක් වන විට 2009 වසර තුළ එය 102 දක්වා පහත වැටීමක් දැකිය හැකිය. 2008 වසරට සාපේක්ෂව මෙයට බලපෑ හේතු ලෙස ආරක්ෂක හේතුන් මත දුම්රිය මගින් ගමන් කිරීම අඩුවීම හා 2009 වසර තුළ දිවයිනේ ආර්ථික ක්ෂේත්‍රයේ පසුබෑම නිසාද මෙම තත්වය ඇතිවීමට බලපා ඇත.

එනමුදු මගී ආදායම 2008 වසරේ මිලියන 2723 ක් වන විට 2009 දී එය මිලියන 3266 දක්වා ඉහළ ගොස් ඇත. එය ප්‍රතිශතයක් වශයෙන් 20% න් ඉහළ යාමක් වේ.

භාණ්ඩ ප්‍රවාහනය

2009 වසර තුළ භාණ්ඩ ආදායම, ටොන් සහ ටොන් කිලෝමීටර් ප්‍රමාණය පහත සඳහන් ලෙස දැක්විය හැක.

	2008	**2009**
භාණ්ඩ ආදායම (මිලියන)	363.4	337.1
භාණ්ඩ ටොන් (මිලියන)	1.69	1.64
ටොන් කි.මී. (මිලියන)	120.66	118

ඉහත සංඛ්‍යා සටහනට අනුව ආදායම 2008 ට සාපේක්ෂව 2009 වසරේදී 7% කින් පහළ ගොස් ඇත. එමෙන්ම 2008ට සාපේක්ෂව ගත් කළ 2009 වසරේද භාණ්ඩ ටොන් සහ ටොන් කි.මී.ප්‍රමාණයේ අඩු වීමක් දැකිය හැක.

කෙසේ වුවද මෙම වසර තුළදී ද පෙර මෙන්ම භාණ්ඩ ප්‍රවාහනය පහත වැටීම සම්බන්ධයෙන් ගත් කළ දුම්රියන් ප්‍රවාහනය කිරීමේදී පැටවීම හා ඉවත් කිරීම් වලදී කාලය පිළිබඳ ප්‍රශ්නය මතුවන බැවින් දුම්රිය වෙනුවට විකල්ප ප්‍රවාහන ක්‍රම අනුගමනය කරනු ලබයි. තවද භාණ්ඩ ප්‍රවාහන ගාස්තු සංශෝධනයන් ද ප්‍රධාන වශයෙන් බලපා ඇත. පෞද්ගලික ලොරි, කන්ටේනර් වල භාණ්ඩ ප්‍රවාහනය කිරීම හා වැගන් සහ එන්ජින් වල හිඟය ද ටොන් ප්‍රමාණය අඩු වීමට ප්‍රධාන වශයෙන් බලපෑවේය.

පහත වගුව මගින් 2009 වසර තුළ භාණ්ඩ ටොන් ප්‍රමාණය ඒ ඒ වර්ගයන් යටතේ දැක්වූ දායකත්වය පෙන්නුම් කරයි.

ඒකකය	**ටොන් ප්‍රමාණය**
කෘෂිකාර්මික නිෂ්පාදන	38,488
ඛනිජතෙල් නිෂ්පාදන	454,835
සිමෙන්ති	1,149,422
නිපැයුම්	3,229
ගොඩනැගිලි ද්‍රව්‍ය	875
වෙනත්	639
එකතුව	***1,647,488***

සිවිල් යුද්ධය අවසන් වීමත් සමග උතුරු පලාත සංවර්ධනය කිරීම යටතේ ආරක්ෂක අමාත්‍යාංශය සමග ඇතිකරගත් එකඟතාවයකට අනුව 2009 වසරේ සිට නැවත දුම්රිය සේවය මගින් කන්ටේනර් ප්‍රවාහනය අරඹමින් කොළඹ සිට වව්නියාව දක්වා තාවකාලික නිවාස ඉදිකිරීමේ අයිතමයන් ප්‍රවාහනය කරන ලදී. එමෙන්ම පුද්ගලික අංශයේ වෙළඳ සමාගමක් සමග ඇතිකරගත් ගිවිසුමකට අනුව අහාර ද්‍රව්‍ය කොළඹ සිට වව්නියාව දක්වා දුම්රියෙන් ප්‍රවාහනය අරඹන ලදී.

නැවත දුම්රියෙන් බහාලු ප්‍රවාහනය ආරම්භ කිරීම.

දුම්රිය රක්ෂිත ඉඩම් රැකීමේ වැඩ පිළිවෙල

ඉඩම් බදු දීම තුළින් ලද ආදායම රු. 41,730,820 වන අතර මෙම වසර තුළ අළුතින් බදුකර නිකුත් කර නොමැත. බදු ලිපි ගොනු 7421 ක් දක්නට ලැබුණද සක්‍රීය බදු ලිපිගොනු සංඛ්‍යාව 6000 ක් පමණ විය.

මිලදී ගැනීම්

2009 වසර තුළ අවසන් කරන ලද ප්‍රසම්පාදන කමිටු තීරණ වලට අදාල විදේශීය මිලදී ගැනීම් රුපියල් මිලියන 1,463.4 ක් හා දේශීය මිලදී ගැනීම් රුපියල් මිලියන 2,623.9 ක් විය.

එමෙන්ම අත්තිකාරම් ගිණුම සඳහා 2009 වසර වෙනුවෙන් රුපියල් මිලියන 1800 ක වෙන් කරන ලද අතර වසර තුළ අත්තිකාරම් ගිණුමේ වියදම රුපියල් මිලියන 1794 ක් විය. ඉන්ඩෙන්ට් යටතේ මිලදී ගත් භාණ්ඩ වල වටිනාකම රුපියල් මිලියන 790.7 ක් විය.

ජාත්‍යන්තර දුම්රිය සම්බන්ධතා

පහත දැක්වෙන ජාත්‍යන්තර ආයතන සමඟ නොකඩවා සම්බන්ධතා පැවැත්වීම.

- SAARC – (Trans Asia Railway).
- ESCAP – (Trans Asia Railway) ආසියානු සහ පැසිපික් කලාපීය ආර්ථික සහයෝගිතා කොමිසම.
- UIC – ලෝක දුම්රිය සමුළුව.
- ADB – ආසියානු සංවර්ධන බැංකුව.
- BIMSTEC – ආසියානු කලාපීය දුම්රිය සහයෝගිතා සමුළුව.

  කලාපීය දුම්රිය සංවර්ධනය උදෙසා සාර්ක් සහ බිම්ස්ටික් (BIMSTEC) කලාපයන් හි පොදු දුම්රිය ජාලයක් ගොඩනැගීම සඳහා වන ක්‍රියාවලියේ ශ්‍රී ලංකා දුම්රිය සේවයේ කාර්යභාරය ඉටුකරන ලදී.

  අන්තර් රාජ්‍ය දුම්රිය සේවා ආරම්භ කිරීමට මූලික වන ගිවිසුම් දෙකකට එළඹීමට පදනම දමන ලදී.

ලෝක දුම්රිය සේවාවේ සාමාජිකයෙකු ලෙස වාර්ෂිකව පවත්වන වැඩසටහන් වලට සහභාගී වන ලදී.

දුම්රිය පදනම් කොට ගත් බහාලු අංගනයක් පිහිටුවීම සඳහා ශක්‍යතා අධ්‍යනයක් කිරීමට ආසියානු සංවර්ධන බැංකුව සමග සාකච්ඡා සම්මුතියකට එළඹෙන ලදී.

දුම්රිය ආරක්ෂක හමුදා වාර්ෂික මෙහෙවර

2009 වර්ෂයේ දී දුම්රිය ආඥා පනත යටතේ වූ වැරදි සම්බන්ධයෙන් දුම්රිය ආරක්ෂක හමුදාව මගින් පුද්ගලයින් 2213 දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇති අතර අධි ගාස්තු හා දඩ මුදල් වශයෙන් රු. 1,840,998 අයකර ගෙන ඇත.

ඉහත අත්අඩංගුවට ගත් පුද්ගලයන් අතුරින් 29 දෙනෙකු අධිකරණය වෙත ඉදිරිපත් කර දුම්රිය ආඥා පනත යටතේ නඩු පවරා රු. 61870 මුදලක් අය කර ගෙන ඇත.

දු.ආ.හ. මගින් 2009 වර්ෂය තුළදී දණ්ඩනීති සංග්‍රහය යටතේ සුරාබදු හා මත් ද්‍රව්‍ය ආඥා පනත යන අණ පනත් යටතේ වූ වැරදි සම්බන්ධයෙන් දුම්රිය සීමාව තුළදී 64 දෙනෙකු අත් අඩංගුවට ගෙන ශ්‍රී ලංකා පොලිසිය හා සුරාබදු දෙපාර්තමේන්තුව මගින් ඔවුනට එරෙහිව අධිකරණයෙන් නඩු පැවරීමට කටයතු කර ඇත.

අධිකරණයට ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් සැකකරුවන්ට බරපතල වැඩ සහිතව/රහිතව සිර දඬුවම් ද, අත්සිටවූ සිරදඬුවම්ද නියමකර මෙතෙක් නිම වූ නඩු වලින් රු.121770 ක උසාවි දඩ වශයෙන් නියම කර ඇත.

දුම්රිය උරුමය ආරක්ෂා කිරීම

පෞරාණික වස්තූන් රැකගැනීම සඳහා දීර්ඝ කාලයක් තිස්සේ ප්‍රයෝගිකව ක්‍රියාත්මක නොවුණ දුම්රිය කෞතුකාගාරය පිහිටුවීමට කටයුතු කිරීම හා එය 2009 මැයි මස 11 වැනි දින ජනතා අයිතියට පවරන ලදී.

ජාතික දුම්රිය කෞතුකාගාරය ජනතා අයිතියට පැවරූ දින.

දුම්රිය සේවයේ දියුණුවට ඇති බාධා සහ සීමාවන්

- පරිපාලනමය ගැටළු.
- බඳවා ගැනීමේ උසස්වීම් ලබා දීම සම්බන්ධයෙන් පවතින සීමාවන්.
- තීරණ ගැනීමේදී කළමනාකාරීත්වයට ඇති සීමා.

  උදා:- විනය, ආයතන ඇබෑර්තු පිරවීමේදී ඇතිවන සීමාවන්.
- වත්කම් නඩත්තුව සඳහා නියමිත ප්‍රතිලාභ නොලැබීම.
- දෙපාර්තමේන්තු වත්කම් පිරිහීම.
- විශේෂඥ දැනුම හිඟකම.
- දුම්රිය රක්ෂිත වල අනවසර පදිංචිය.

දැනට ක්‍රියාත්මක වෙමින් පවත්නා සහ විශාල ව්‍යාපෘති

- මහින්ද චින්තනය ඉදිරි දැක්ම මගින් සිදු කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති.
  - මුහුදුබඩ දුම්රිය මාර්ගය බෙලිඅත්ත දක්වා දීර්ඝ කිරීම.

    ඇගයීම් කමිටුව මගින් ලැබීඇති ව්‍යාපෘති යෝජනා ඇගයීම් අවසන් වෙමින් පවතී.
  - උතුරු දුම්රිය මාර්ගය කන්කසන්තුරේ දක්වා දීර්ඝ කිරීම.

    මෙම ව්‍යාපෘතිය මගින් ඕමන්තේ සිට පලෙයි දක්වා සහ පලෙයි සිට කන්කසන්තුරේ දක්වා අදියර දෙකක් යටතේ මාර්ගය ඉදිකිරීම හා උතුරු මාර්ගයෙහි ධාවනය සඳහා අළුතින් එංජින් හා ගැල් මැදිරි ගෙන්වීමට ද අපේක්ෂා කරයි.

    තාන්ඩිකුලම් සිට ඕමන්තේ දක්වා දෙපාර්තමේන්තුව මගින් ඉදිකිරීම් කටයුතු කරනු ලබයි. ඕමන්තේ සිට පලෙයි දක්වාත් පලෙයි සිට කන්කසන්තුරේ දක්වාත් විදේශීය ආධාර සහිතව ඉදිකිරීම් කටයුතු කිරීමට මූලික සාකච්ඡා ආරම්භ කර ඇත.
  - මැදවච්චිය සිට තලෙයිමන්නාරම දක්වා මාර්ගය ඉදිකිරීම.

    මෙම මාර්ගය ද අදියර දෙකක් යටතේ මැදවච්චිය සිට මඩු දක්වා සහ මඩු සිට තලෙයිමන්නාරම දක්වා මාර්ගය ඉදිකිරීමට අපේක්ෂා කරයි.
  - කොළඹ කොටුව - කටුනායක ගුවන් තොටුපල අතර සුඛෝපභෝගී දුම්රිය සේවාවක් ඇති කිරීම.

    සංකල්ප වාර්තා ඉදිරිපත් කර ඇත.
  - ප්‍රධාන දුම්රිය ස්ථාන 25 ක් නවීකරණය කිරීම.

    බහුවිධ අංගයන් සහිත සංකීර්ණයක් ලෙස මෙම දුම්රිය ස්ථාන නවීකරණය කිරීමට අපේක්ෂිතයි.

- අභ්‍යන්තර බහාලූ අංගන පිහිටුවීම.

  පුද්ගලික අංශයේ ද සහභාගිත්වය සහිතව බහාලුම් සේවාවන් ආරම්භ කිරීමට අපේක්ෂා කරයි. ආසියානු සංවර්ධන බැංකුවේ ආධාර සහිතව ශක්‍යතා අධ්‍යයනයක් සිදුකිරීමේ යෝජනාව සලකාබලමින් පවතී.

- දුම්රිය ඉඩම් සහ දේපල සංවර්ධනය කිරීම.

  ප්‍රතිසංවිධානය සඳහා යෝජනා සකසමින් පවතී.

- කොළඹ තදාසන්න සේවා විදුලිකරණය.

  සංකල්ප වාර්තාවක් ඉදිරිපත් කිරීමට සූදානම් කරන ලදී.

- කොළඹ නගරය අවට මෙට්‍රෝ දුම්රිය සේවාවක් ඇතිකිරීම.

  තාක්‍ෂණ දැනුම සම්බන්ධ දායකත්වය ලබාදී ඇත.

➢ මුහුදුබඩ දුම්රිය මාර්ගය නවීකරණය.

  - කළුතර සිට මාතර දක්වා දුම්රිය මාර්ගය නැවත ඉදිකිරීම. දුම්රිය ගමන්වේගය පැයට කිලෝමීටර 120 දක්වා ඉහළ නැංවීම සඳහා අවශ්‍ය මාර්ග ව්‍යුහය සැකසීම (රේල් පීලි/සිල්පර/ බැලස්ට්) මෙම ව්‍යාපෘතියෙහි අරමුණයි.
  - බලවේග කට්ටල 20 ක් මිලදී ගැනීම හා එංජින් 03 ක් මිලදී ගැනීම.
  - ධාවනාගාර 03 ක් අළුතින් ඉදිකිරීම.
  - යන්ත්‍ර සූත්‍ර හා උපකරණ මිලදී ගැනීම.
  - අමතර කොටස් මිලදී ගැනීම.
  - දුම්රිය සේවකයන් 600 කට විදේශීය පුහුණුව ලබාදීම.

➢ බලවේග කට්ටල 13 ක් ආනයනය කිරීම (04 ක් කැළණිවැලි මාර්ගයට/07ක් උතුරු මාර්ගයට/02ක් සංචාරක සේවා සඳහා).

  නුවර කොළඹ නගරාන්තර සේවයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම, කැළණි වැලි මාර්ගයේ දුම්රිය සේවය පුළුල් කිරීම, දුම්රිය සංචාරක සේවා පුළුල් කිරීම මෙම ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ඉලක්ක වේ.

➢ ටැංකි වැගන් 15 ක් මිලදී ගැනීම.

  ඛණිජ තෙල් ප්‍රවාහනය ඉහළ නැංවීමට අපේක්ෂා කරයි.

➢ නව විදුලි සංදේශ පද්ධතියක් පිහිටුවීම.

  අවුරුදු 20 ක් පැරණි නිතර දෝෂ වලට ලක්වන පැරණි ක්‍රමය වෙනුවට නව ක්‍රමයක් ස්ථාපනය කිරීම

➢ සපුගස්කන්ද දුම්රිය මාර්ගය.

  බහාලූ අංගන සඳහා දුම්රිය පහසුකම් ලබාදීම සඳහා.

➢ අතිරේක කොන්ක්‍රීට් සිල්පර නිෂ්පාදන කර්මාන්තශාලාවක් පිහිටුවීම.

මූල්‍ය පුරෝකථනය

	2008	2009	2010	2011	2012
ආදායම	**3671**	**4019**	**4040**	**4232**	**4374**
මගී	2723	3266	3329	3479	3583
භාණ්ඩ	470	452	477	506	528
වෙනත්	478	301	234	248	262
විචල්‍ය පිරිවැය	**4480**	**3900**	**3915**	**3987**	**4052**
ඉන්ධන	3035	2315	2320	2366	2402
දීමනා	1204	1317	1324	1344	1371
වෙනත්	242	268	272	277	280
දායකත්වය	**(809)**	**119**	**125**	**246**	**322**
ස්ථාවර පිරිවැය	4152	4231	4358	4532	4532
ශුද්ධ ලාභ/අලාභ	**(4961)**	**(4112)**	**(4233)**	**(4287)**	**(4210)**